## 213 නැත මට තනියක්

නැත මට තනියක් නැත මට හිඟයක්
සමිඳුන් මා ලඟ සිටින තුරා
නැත මට සතුරන් ඇත මට මිතුරන්
සමිඳුන් මා ලඟ සිටින තුරා

ගමන් කරන්නට මඟක් නැතිව මට
දහස් වාරයක් ලතවී සිටි මම //
යායුතු ඒ මග ක්‍රිස්තුනි ඔබ බව
ඔබ හමුවීමෙන් අත් දැක්කෙමි මම

ජීවත් වුවද සමාජයේ මම
හද තුල මිරිකී මිය ගොස් සිටි මම //
හද පිරි සතුටින් එකමුතු කමකින්
ජීවත් වෙමි දැන් ඔබ හමු වූ මම

මගේ හදවත පැලී ඉරි තැලිලා ඇත
සුවය ලබන්නට ආවෙමි ඔබ වෙත.
මොර දුන්නෙමි මම අඳුරේ සිටගෙන
ඔබ විය ආලෝකය මගේ දිවියට